කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය.

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

---------------------------

ගිණුම් පිළියෙළ කිරීමේ දි අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

**------------------------**

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ)** **සභාවට අයත් ගොඩනැගිලි 228 ක වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ)** **සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිල දී ගැනීමේ දී, රු.45,288 ක ලැබූ වට්ටම් ගිණුම්ගත කර නොතිබුණු අතර, එම ප්‍රමාණයෙන් පුස්තකාල පොත්වල වටිනාකම ද අඩුවෙන් දක්වා තිබුණි.**

**(ඇ)** **සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් රු.5,840,000 ක් වියදම් කර ඉදි කර තිබූ සහ වැඩි දියුණු කළ කර්මාන්ත 08 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.**

**(ඈ)** **සමාලෝචිත වර්ෂයේ ඍජු බැර කිරීම් ලෙස ලැබී තිබූ ස්ථාවර තැන්පතු පොළී රු.263,219 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ලැබියයුතු පොළී ලෙස ගිණුම්වල දක්වා තිබුණි.**

**(ඉ)** **සමාලෝචිත වර්ෂයේ රු.118,600 කට මිල දී ගෙන තිබුණු ටෝනර් 12 ක්, යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ ගිණුමට හර කර, ප්‍රාග්ධනිත කර තිබුණි.**

**(ඊ)** **සමාලෝචිත වර්ෂයේ මිල දී ගන්නා ලද රු.13,990 ක් වටිනා සැම්සුන් කැමරාව, යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ගිණුමේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි.**

**(උ)** **සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද යතුරු පැදි 03 ක් සඳහා නොමිලේ ලබා දෙන ලද හිස් වැසුම් (Helmet) 03 ක් සහ කබා 03 ක් හි වටිනාකම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි.**

**(ඌ)** **සමාලෝචිත වර්ෂයේ සභාව වෙත ලැබී තිබුණු රු.275,000 ක් වටිනා ඖෂධවලින් වර්ෂයට අදාළ වියදම හා අවසන් තොගය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.**

(එ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගන්නා ලද කාර්යාල හැඳුනුම්පත් 75 ක් වෙනුවෙන් ගෙවන ලද රු.24,750 ක වටිනාකම ලී බඩු හා කාර්යාල උපකරණ ගිණුමේ ගිණුම්ගත කර ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගන්නා ලද රු.154,485 ක් වටිනා තක්සේරු කාඩ්පත්, ලිපි ද්‍රව්‍ය වියදම් වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට ලී බඩු හා කාර්යාල උපකරණ වශයෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ විටින් විට මිල දී ගෙන තිබුණු ගණක යන්ත්‍ර, මයික්, මයික් ස්ටෑන්ඩ්, විදුලි කේතල, කාර්යාල මළු, විදුලි පංකා, බිත්ති ඔරලෝසු, කැමරා යනාදි ද්‍රව්‍ය හා උපකරණ නිසි වර්ගීකරණ පදනමකින් තොරව ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතුව තිබූ ජල, විදුලි සහ දුරකථන ගාස්තු රු.112,587 ක්, උපචිත වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඛ) සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් බදු අධි ගාස්තු හා ප්‍රමාද දඩ මුදල් රු.805,217 ක් දඩ හා වරෙන්තු ගාස්තු යටතේ ගිණුම්ගත කළයුතු වුව ද, වරිපනම් හා බදු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ග) නාගරික සංවර්ධන අධිකාරියට අදාළ ඉතිරි කිරීම් බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,620,472 ක් වුවත්, ලෙජර් ගිණුමේ එය රු.1,526,156 ක් ලෙස දැක්වීම තුළින් රු.94,316 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය රු.481,336 ක් වුවත්, ගිණුමෙහි රු.448,374 ක් ලෙස රු.32,962 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ද) සභාව විසින් ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.**

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්.**

**----------------------------**

**ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.36,880,572 ක් වූ අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.15,589,700 ක් වුයෙන්, රු.21,290,872 ක නොසැසඳීමක් අනාවරණය වුණි.**

**1.3.4 අවිනිශ්චිත ගිණුම්.**

**-------------------**

**සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමෙහි රු.15,383 ක බැර ශේෂයක් පැවතුණු අතර, එම ශේෂය සොයා බලා, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**---------------------------------**

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ එකතුව රු.39,669,841 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,292,516 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම**

රු.49,012,492 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.280,024 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.20,465,294 ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.33,233,073 ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.12,767,779 ක මුදලක් සභා සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කරන බව නිරීක්ෂණය වන අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර, සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට 16 ක් වී තිබුණි.

**2.3** ආදායම් පරිපාලනය.

----------------------

**2.3.1** ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

-----------------------------------------

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 23,278 | 9,479 | 6,173 |
| (ii) බදු කුලී | 9,353 | 9,320 | 848 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5.801 | 5,511 | -- |
| (iv) වෙනත් ආදායම් | 38,365 | 43,792 | 14,171 |

**2.3.2** වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.8,400,379 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම්වලින් අය කිරීම් රු.4,562,179 ක් වූයෙන්, වර්ෂයේ අය කිරීමේ ප්‍රතිශතය සියයට 62.76 ක් වී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.6,173,360 ක ශේෂය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්තිවල විධිවිධාන අනුගමනය කර, 2014 මැයි 31 දින වන විටත් හිග ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3** කසළ බදු.

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,022,397 ක හිගයක් පැවති අතර, වර්ෂය අවසානයේ හිගය රු.912,687 ක් විය. හිගයෙන් අයවීම සියයට 35 ක තරම් දුර්වල මට්ටමක පැවතුණු අතර, එම මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.3.4** කඩ කුළී.

-----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශිය සභාවට අයත් කඩ කාමර ලබාගෙන තිබු බදුකරුවන් විසින් බදු ගිවිසුම් අනුව, නියමිත වාරික මුදල් ගෙවීම පැහැර හැරිම හේතුවෙන්, 2013 දෙසැම්බර් 31 දිනට රු.991,830 ක මුදලක් හිඟව පැවතුණි.

(ආ) දිගන අංක 01 හා 02 දරන ගවමස් කඩ කාමරයට අදාළව 2008 සහ 2009 වර්ෂවල හිග කඩ කුළී වශයෙන් රු.1,300,188 ක මුදලක් අය වියයුතුව තිබුණි.

**2.3.5 ත්‍රී රෝද රථ නැවතුම් සඳහා බලපත්‍ර**

**---------------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) ත්‍රී රෝද රථ සඳහා වර්ෂයකට රු.600 ක ගාස්තුවක් මත, බලපත්‍ර නිකුත් කිරීමක් සභාව විසින් සිදු කරනු ලබන අතර, 2013 දෙසැම්බර් 31 දිනට රු.1,861,151 ක හිග ශේෂයක් පැවති අතර, එම හිග ශේෂය අය කිරීම සඳහා කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**(ආ) ත්‍රී රෝද රථවලින් බලපත්‍ර ගාස්තු අය කර ඇති අවස්ථාවල එම ත්‍රී රෝද රථ සඳහා විධිමත් බලපත්‍රයක් නිකුත් කර නොතිබුණු අවස්ථා අනාවරණය විය.**

**(ඇ) ත්‍රිරෝද රථ සඳහා බලපත්‍ර නිකුත් කරමින් සභාවට අවශ්‍ය ආදායම් ඉපයීම ආදායම් පරීක්ෂකවරුන්ගේ කාර්යය භාරයයක් ලෙස පවරා තිබුණ ද, සමහර නැවතුම්පළවල් සඳහා බලපත්‍ර නිකුත් නොකර තිබූ අතර, ආදායම් එකතු කිරීම ද දුර්වල මට්ටමක පැවතුණි.**

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**------------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.226,752 ක් හා මුද්දර ගාස්තු රු.13,096,013 ක් ලැබියයුතුව පැවතුණි.**

**2.3.7 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

**------------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිදු කරන ලද නියැදි භෞතික පරීක්ෂාවේ දි දූරකථන සම්ප්‍රේෂණ කුළුණු 22 ක් අනවසරයෙන් ඉදි කර තිබූ අතර, ප්‍රාදේශීය සභාවේ කිසිදු පසු විපරමකට ලක් වී නොතිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/ 8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව, දූරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ වැඩි වන සෑම මීටර් එකකටම රු.100 ක් බැගින් ගාස්තු අදාළ සමාගම්වලින් අය කළයුතු වුවත්, සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ අනවසර සම්ප්‍රේෂණ කුළුණු 22 කට අදාළව ගාස්තු අය නොකිරීම හේතුවෙන්, රු.440,000 කට වැඩි මුදලක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) ක්ෂේත්‍ර නිලධාරීන් තම බල ප්‍රදේශයන් හී ඉදි කර තිබූ අනවසර සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධව සභාවට වාර්තා කර, ඒ අනුව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් යථෝක්ත ගැසට් නිවේදනයේ V උපලේඛනය සඳහන් පරිදි අනවසර කුළුණු නීත්‍යානුකූල කිරීමේ දි, උස සෑම මීටර් 05 කටම රු.10,000 ක් බැගින් ගාස්තු අය කිරීමට ඇති හැකියාව ද සළකා බලා නොතිබුණි.

(ඇ) සම්ප්‍රේෂණ කුළුණු ඉදි කර තිබූ සෑම ඉඩමක, ගොඩනැගිල්ලෙහි වාර්ෂික තක්සේරුව වැඩි වියයුතු අතර, එයට සාපේක්ෂව අදාළ වරිපනම් ගාස්තු ඉහළ දැමීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඈ) මධ්‍යම පළාතේ සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතා ඇති පළාත් පාලන කොමසාරිස්ගේ 2014 ජුනි 18 දිනැති අංක 2014/4 දරන චක්‍රලේඛයට අනුව ආදායම් අයකර ගැනීමේ ව්‍යවස්ථාපිත වගකීමට සභා ලේකම්, ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක හා විෂයය භාර නිලධාරීන් ද බැඳී සිටින බව අවධාරණය කර ඇතත්, දූරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 කට අදාළව කුළුණු මගින් පහසුකම් සපයන ආයතන හඳුනා ගෙන 2013 වර්ෂය දක්වා ව්‍යාපාර බදු අය කිරිමට ද කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**-------------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **සභාව සතු ක්‍රීඩාංගන කුළියට දීම සිදු කර ඇතත්, අය කරන ගාස්තු සටහන් කරනු ලබන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.**

**(ආ)** **සභාවට අයත් රු.207,340,000 ක් වටිනා සුසාන භූමි 31 ක් හා වටිනාකම දක්වා නොතිබුණු ඉඩම් කැබලි 323 ක වටිනාකම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි.**

**3.2** **කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**--------------------------------------**

**මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1:1.43 වූ අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වූ 1:1.25 ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වූයෙන්, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 28 ක් හෙවත්, රුපියල් මිලියන 25.3 ක් කර්මාන්ත ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 59 ක් හෙවත්, රුපියල් මිලියන 76.8 ක් ඇප සහ විවිධ තැන්පතුවලින් සමන්විත වී තිබුණි.**

**3.3** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**-----------------------------------------**

**සමාලෝචිත වර්ෂය අවසානයට රු.561,000 ක වටිනාකමක් වූ වත්කම් වර්ග 03 ක් අවුරුදු 01 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතිණ.**

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

**-------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) කර්මාන්ත සඳහා දැන්වීම් පුවරු සවි කිරීම වෙනුවෙන් එක් මාර්ගයක් වෙනුවෙන් රු.6,000 ක් බැගින් මාර්ග 05 ක් සඳහා රු.30,000 ක් ගෙවීම් කර තිබුණ ද, අදාළ මාර්ගයන් හී නියමිත දැන්වීම් පුවරු සවි කර නොතිබුණි.**

**(ආ) අන්තර් සම්බන්ධිත කොන්ක්‍රිට් ගල් අල්ලා, වැඩ නිම කළ පිංතාලි හංදිය ගල් මඩුව මාර්ගයේ අඩි 618 ක් සඳහා ගෙවීම් කර තිබුණ ද, භෞතික පරික්ෂාවේදි මාර්ගයේ දිග අඩි 615 ක් බව අනාවරණය වූ අතර, මාර්ගය අවසානයේ අඩි 36 ක ප්‍රමාණයක අවස්ථා 04 ක සිදු කළ පරික්ෂාවේදි අගල් 06 ක් ඝනකමකින් ඉදි කළයුතු ආරක්ෂිත වැටියේ කොන්ක්‍රිට් ඝනකම 4" , 6" 3 ½" ක ප්‍රමාණයෙන් ඉදිකර තිබුණි.**

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**-------------------------------------**

**4.1 සංයුක්ත සැළැස්ම.**

**----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-----------------------**

**රු.88,985,611 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 විගණන හා කළමනාකරණ කමිටු.**

**-------------------------------------**

**සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.**

**4.4 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.5 අයවැය පාලනය.**

**------------------**

**පහත නිරීක්ෂණන් කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය සදහා පිළියෙළ කර තිබුණු අය වැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේ දි, ආදායම් විෂයයන් 06 කට සියයට 74 සිට සියයට 186 දක්වා ද, වියදම් විෂයයන් 08 ක සියයට 672 සිට සියයට 12 දක්වා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අය වැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව විගණනයේ දි නිරීක්ෂණය විය.**

**(ආ) ආදායම් ශීර්ෂ 03 කට අයත් උප විෂයයන් 10 ක් සදහා අයවැයගත කළ රු.35,602,594 ක් වු ආදායම් අයවීම් ප්‍රතිශතය සියයට 29 ක් විය.**

**(ඇ) ආදායම් ශීර්ෂ 05 ක්, උප විෂයයන් 04 ක් සදහා අයවැයගත රු.150,000 ක් වු ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලන.**

**--------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) අභ්‍යන්තර විගණනය**

**(ඇ) ආදායම් පරිපාලනය**